tracks
www.tracks.uk.net



# ශ්‍රී ලංකාවට ආපසු යාම

# Returning to Sri Lanka


Praxis
COMMUNITY
PROJECTS

National Offender
Management Service

## ශ්‍රී ලංකාවට ආපසු යාම

ඔබ ඉවත් කරනු ලැබීමට හෝ ශ්‍රී ලංකාව වෙත පිටුවහල් කිරීමකට මුහුණ පා සිටී නම් මෙම ලේඛනය මඟින් ඔබට ප්‍රයෝජනවත් විය හැකි ආයතනවල විස්තර ලබා දේ.
තොරතුරු නිවැරදි බවට වග බලා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලබන නමුත් ලැයිස්තුගත කර ඇති සේවාවන් එම ආයතන මඟින් සලසනු ලැබේද යන්න පිළිබඳව සහතිකයක් මෙයින් ලබා නොදේ.

## UK තුළ ඔබේ තානාපති කාර්යාලය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහ කොමසාරිස් කාර්යාලය
13 Hyde Park Gardens, London W2 2LU
දුර: 020 7262 1841 ෆැක්ස්: 020 7262 7970
ඊමේල්: mail@slhc-london.co.uk / consular@srilankahighcommission.co.uk
වෙබ් අඩවිය: **www.srilankahighcommission.co.uk**

## ගමන් ලේඛන




එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට යාමට වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රයක් භාවිතා කළ හැක. ඔබේ විදේශ ගමන් බලපත්‍රය කල් ඉකුත් වී තිබේ නම් ඔබට ඒ වෙනුවට වෙනත් එකක් සඳහා ඉල්ලුම් කළ හැක.

ඔබට විදේශ ගමන් බලපත්‍ර යේ මුල් පිටපත හෝ කල් ඉකුත් වූ විදේශ ගමන් බලපත්‍රයක් නැති නම්, හදිසි ගමන් ලේඛනයක් ලබා ගැනීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම්පත්‍රයට පහත දේ ඇතුළත් විය යුතුය
:
ETD ඉල්ලුම්පත්‍ර හෝ තවදුරටත් සාක්ෂි තහවුරු කරන ලිපියක් ලබා දෙන ලෙස ඉල්ලන ලිපියක්;
IS33 ආකෘතිය;

- ජීව දත්ත ආකෘතිය;
- පුද්ගලයාගෙන් සහ ස්වදේශීය කාර්යාලයෙන් ඉල්ලුම්පත්‍රයක්
- පාස්පෝට් ඡායාරූප 4ක්
- කල් ඉකුත්වූ විදේශ ගමන් බලපත්‍රය, උප්පැන්න සහතිකයේ මුල් පිටපත හෝ පිටපත හෝ රියැදුරු බලපත්‍රයේ මුල් පිටපත හෝ පිටපත හෝ හැඳුනුම්පතේ මුල් පිටපත හෝ පිටපත ඇතුළුව වෙනත් තහවුරු කිරීමේ ලේඛන තිබේ නම් ඒවා
- එක්සත් රාජධානියෙහි උපන් ළමයින් ඇත්නම් සම්පූර්ණ එක්සත් රාජධානි උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය;

ලේඛනමය ක්‍රියාවලියේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සමග මුහුණට මුහුණ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම අනිවාර්යය. සම්මුඛ පරීක්ෂණ මහ කොමසාරිස් කාර්යාලවල, HO වාර්තාකරණ මධ්‍යස්ථානවල හෝ ආගමනිකයන් ඉවත් කිරීමේ මධ්‍යස්ථානවල පැවැත්වේ.

## ආපසු යාම



ඔබ ආපසු යාමට කැමති නම් සහ ඔබට හැකි ඉක්මණින් ශ්‍රී ලංකාවට යා යුතු නම් ඔබට පහත දේ කළ හැක:

- ස්වදේශීය කාර්යාලයේ සිටින සිද්ධි නිලධාරියා අමතා ඔබ ආපසු යාමට කැමති බව දන්වන්න;
- ගමන් ලේඛන නිකුත් කිරීමට තහවුරු කිරීමේ ලේඛන සොයා ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරන්න;
- ගමන් ලේඛන ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරිමට ශ්‍රී ලංකා කන්සියුලර් කාර්යාලය හා සම්බන්ධ වෙන්න.

ආපසු යාම සඳහා සූදානම් වීමේදී පහත තොරතුරු කියවීම ඔබට ප්‍රයෝජනවත් විය යුතුය.

## ලංකාවේ ලේඛන



විදේශ ගමන් බලපත්‍රයක්, රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට අවුරුදු 16ට වැඩි ශ්‍රී ලංකාවේ සියළුම පුරවැසියන් සතුව ජාතික හැඳුනුම්පත (NIC) තිබිය යුතුය. ඒවා ඉල්ලුම් කිරීමට ඔබ විසින් ඉල්ලුම්පත්‍රයක් සම්පූර්ණ කළ යුතු අතර වයස තහවුරු කිරීමට උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් කිරීම පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීමට ශ්‍රී ලංකාවේ රාජ්‍ය තොරතුරු කේන්ද්‍ර යේ පහත වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: **www.gic.gov.lk**

## නවාතැන්

ශ්‍රී ලංකාවේ සමාජයීය නිවාස ජාලයක් නැත. ශ්‍රී ලංකාවට ආපසු යන පුද්ගලයකුට නවාතැනක් කුලියට ගැනීමට හෝ මිතුරන් හෝ ඥාතීන් මත රඳා පැවතීමට සිදු වේ.

## සෞඛ්‍යය

ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුටම නොමිලේ සෞඛ්‍ය පහසුකම් ලැබේ. පෞද්ගලික සෞඛ්‍ය පහසුකම්ද ලබා ගත හැක. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙවර්ගයේම සෞඛ්‍ය පහසුකම් ප්‍රධාන ටවුම් සහ නගර ආශ්‍රිතව පහසුවෙන් ලබා ගත හැක.

## හදිසි අවස්ථා සඳහා සහාය

විරැකියාවෙන් පෙළෙන, රෝගී හෝ වයස්ගත පුද්ගලයන්ට රජයෙන් සමාජ ආරක්ෂණ ක්‍රියාවලියක් සපයනු නොලැබේ. හදිසි අවස්ථා සඳහා සහාය ලබා දෙන්නේ නම් ඒ ආගමික හෝ පුණ්‍ය ආයතන මගින් පමණි.

## රැකියාව, අධ්‍යාපනය සහ පුහුණුව

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය අදියර පහකට බෙදා ඇත. එනම් ප්‍රාථමික, කණිෂ්ට ද්විතියික, ජ්‍යෙෂ්ඨ ද්විතියික, උසස් පාඨශාලා සහ තෘතියික යනුවෙනි. ප්‍රාථමික අධ්‍යාපනය වර්ෂ 5-6 ක්ද, කණිෂ්ඨ අධ්‍යාපනය වර්ෂ 4 ක්ද පවතී. ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය වර්ෂ 2ක් පවතින අතර එම කාලය තුළ සිසුන් අපොස උසස් පෙළ විභාගයට පෙනී සිටිති. තෘතීයික අධ්‍යාපනය විශ්ව විද්‍යාල මගින් සපයයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නොමිලේ ලබා දෙන අතර එය වයස අවුරුදු 5 සිට 15 දක්වා අතර වයස තුළදී අනිවාර්ය වේ

ශ්‍රී ලංකාවේ තෘතියික අධ්‍යාපනය සහ පුහුණුව පාලනය කරනුයේ වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව පිළිබඳ අමාත්‍යාංශයට අයත් තෘතියික සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කොමිසම මගිනි. යෞවන කටයුතු සහ කුසලතා සංවර්ධන අමාත්‍යාංශය මගින් වෘත්තීය පුහුණු අධිකාරිය හරහා දිවයින පුරා පුහුණු මධ්‍යස්ථානවල විවිධ විෂයයන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. සහභාගී විය හැකි පාඨමාලා සහ පිළිබඳව සහ ඉල්ලුම් කරන ආකාරය පිළිබඳව වැඩිදුර විස්තර ලබා ගැනීමට වෘත්තීය පුහුණු අධිකාරියේ වෙබ් අඩවිය බලන්න:

**www.vtasl.gov.lk**

සාමාන්‍යයෙන් රැකියා අවස්ථා සඳහා සොයා බැලීමට හොඳම ක්‍රමය වන්නේ ඉරිදා පුවත්වපත්වල රැකියා අංශයි.එහෙත් රැකියා අවස්ථා ලැයිස්තුගත කර ඇති ප්‍රයෝජනවත් විය හැකි වෙබ් අඩවි කිහිපයක්ද ඇත, ඒවා නම්:

**www.topjobs.lk**

**www.jobsjobs.lk**

ඔබ එක්සත් රාජධානියෙහි අධයාපනය ලබා ඇත්නම් ඔබට රැකියාවක් ලබා ගැනීමට උපකාරී වන කුසලතාවන් සහ සුදුසුකම් පිළිබඳ සහතික ඔබ සතුව තිබිය හැක. එහෙත් ශ්‍රී ලංකාවේ සේවා යෝජකයන් මෙම සුදුසුකම් පිළි නොගැනීමට ඉඩ ඇත. එසේ වුවහොත් බලයලත් එක්සත් රාජධානි ආයතනයක් විසින් නිකුත් කරන ලද ඕනෑම සුදුසුකමක් තහවුරු කර ගැනීමට බ්‍රිතාන්‍ය මණ්ඩලයට හැකි වීමට ඉඩ ඇත.මේ සඳහා ඔබට මුල් ලේඛනය සැපයීමට සිදු වේ.

## නාමාවලිය

කැරිටාස් ශ්‍රී ලංකා SEDEC
අංක. 133, කිංසි පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 269 18 85 / +94 11 269 39 89    ෆැක්ස්: +94 11 269 51 36
ඊමේල්: directorsec@sitnet.lk

කැරිටාස් ශ්‍රී ලංකා වැඩසටහනට, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල නැවත ඉදි කිරීම් පුනරුත්ථාපනය, නිවාස, ජීවනෝපාය ඇති කිරීම, මානසික සහ සාමාජයීය සහාය, සමාජයීය බල ගැන්වීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන් මගින් අපයෝජනය වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ආරක්ෂිත සංක්‍රමණ වැඩසටහන මගින් සංක්‍රමණය කර ආපහු පැමිණි අයට සහාය ලබා දෙයි.

## යාපනය සාමාජයීය ක්‍රියාකාරකම් මධ්‍යස්ථානය විසින් ප්‍රචණ්ඩත්වයට යටත් වූ

කාන්තාවන් සහ ළමයින් සඳහා
ක්ෂනිකව ප්‍රවේශ විය හැකි ආරක්ෂිත ස්ථානයක් සපයා දෙයි. ආරක්ෂිත නිවස තුළ
තාවකාලික නවාතැන්ද, violence
වෛද්‍ය ආධාරද, නීති උපදෙස්ද ලබා ගත හැක.
අංක. 149 4 වන හරස් වීදිය, යාපනය.
දුරකථනය: +94212223699
ඊමේල්: jsacjaffna@gmail.com

## ජේසුට් ශ්‍රී ලංකා සරණාගත සේවා (JRS)

සංගරපිල්ලේ පටුමග, රම්බායිකුලම, වවුනියාව, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 24 49 22 945 ෆැක්ස්: +94 24 22 25 873
ඊමේල්: joelsj29@yahoo.com

JRSයනු කතෝලික සංවිධානයක් වන අතර සරණාගතයන්ට, අභ්‍යන්තරව අවතැන් වූවන්ට, ආපසු පැමිණි අයට , සහ රැඳවුම්කරුවන්ට සහ දුරකථන රහිත ජනතාවට සහාය ලබා දෙයි. JRSවිසින් ගොවිතැන, ධීවර කටයුතු ආදිය සඳහා අධ්‍යාපනික, වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන සහ ආදායම් උත්පාදන අවස්ථා සපයයි.

## ලක්ෂාන් ඩයස් ඇසෝසියේට්ස් මගින්

ගුවන් තොටුපළ තුළදී සහායද
ආපසු එන පුද්ගලයන්ට තම පවුල හා
නැවත එකතු වීමට සහායද ඇතුළු
නැවත පදිංචි වීමේ සහාය ලබා දෙයි.

දුරකථනය: 0757119417 / 0714534527
ඊමේල්: lakshandias@yahoo.co.uk

## ලංකා+

අංක 5, විජිත ශ්‍රී වෛශාඛ මාවත, ඔබේසේකරපුර, රාජගිරිය,
බස්නාහිර පළාත, කොළඹ, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 4901692 ෆැක්ස්: +94 11 2885014
ඊමේල්: lankaplus@yahoo.com

HIV/AIDSආසාදිත පුද්ගලයන්ට ස්වයං උපකාර කිරීමේ කණ්ඩායම් සහ සහායක ජාල පවත්වාගෙන යයි.

## ශ්‍රී ලංකාවේ නෝර්වේ සරණාගත මණ්ඩලය

හෝර්ටන් පෙදෙස, කොළඹ 7 ශ්‍රී ලංකාව
දුරකථනය: +94 11 26 79 210 ෆැක්ස්: +94 11 26 79 211 ඊමේල්: info@nrc.lk
වෙබ් අඩවිය**: www.nrc.no/?aid=916714819/5**

NRC විසින් සරණාගතයන්ට, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ට සහ නැවත ආපසු පැමිණෙන්නන්ට සහාය ලබා දෙයි. මෙම සේවාවවන්ට තොරතුරු සැපයීම. උපදේශනය සහ නෛතික සහාය ලබා දීම ඇතුළත් වේ.

## ඊලාම් සරණාගතයන් පුනරුත්ථාපනය කිරීමේ සංවිධානය (ශ්‍රී ලංකාව)

2වන මහල,2B,ජයවර්ධන පෙදෙස,හිල් වීදිය ඔස්සේ, දෙහිවල, කොළඹ
දුරකථනය:+94115516520 / 2737334 ෆැක්ස්:+94112734129
ඊමේල්: oferrceylon@sltnet.lk
වෙබ් අඩවිය**: www.oferr.org**

OfERRයනු අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන්ට සහ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලට ආපසු පැමිණෙන්නන්ට උපකාර කරන සරණාගත සංවිධානයකි. OfERRසේවාවන්ට වැඩිහිටියන් සහ ළමයින්ට අධ්‍යාපනය සහ නිපුණතා පුහුණුව ලබා දීම; උපදේශනය සහ සමාජයිය දැනුවත් කිරීම ඇතුළත් වේ. ඔවුහු හදිසි සේවාවන්ද සපයති.

## ධනාත්මක කාන්තා ජාලය

158, පන්සල පාර, මරදාන, කොළඹ 10 , ශ්‍රී ලංකාව
ඊමේල්: pwnprincy@gmail.com

HIV/AIDS ආසාදිත කාන්තාවන් රැක බලා ගැනීම, සහාය ලබා දීම, උපදේශනය සහ යොමු කිරීම.

## ශ්‍රී ලංකා ගලවා ගැනීමේ හමුදාව

ගලවා ගැනීමේ හමුදා මූලස්ථානය
53 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, තැපෙ 193 කොළඹ 2, ශ්‍රී ලංකාව

දුරකථනය: +94 11 243 4660 ෆැක්ස්: +94 11 243 6065 ඊමේල්: sri_thq@sri.salvationarmy.org

වෙබ් අඩවිය: **www.salvationarmy.org/sri/home-page-of-the-salvation-army-sri-lanka**

අවදානමට පත් කණ්ඩායම්වලට සමාජ සහ ශුභ සාධන සේවා සහ හදිසි නවාතැන් සේවාවන් සපයයි.

## සර්වයිවර්ස් ඇසෝසියේටඩ්

අංක.22, මෙල්ෆර්ඩ් චන්ද්‍රවංකය, දෙහිවල, ශ්‍රී ලංකාව.
දුරකථනය: + 2738313 / +2735408 ෆැක්ස්:+ 4200559
ඊමේල්:suraso@eureka.lk වෙබ් අඩවිය: **www.survivorsassociated.org**

සර්වවයිවර්ස් ඇසෝසියේටඩ් විසින් වධ බන්ධනවලින් දිවි ගලවා ගත්තවුන්ට, අභ්‍යන්තරව අවතැන් වූ අයට සහ පවුල්වල ප්‍රධානීන් වන කාන්තාවන්ට වැනි අවධානය යොමු නොවූ කණ්ඩායම්වලට සමස්තය රැකවරණය සපයයි. සේවාවන්ට මානසික සහ ආබාධිතයන් පුනරුත්ථාපනය පිළිබඳ පුහුණුව, ආර්ථික බලගැන්වීම සහ ගැටුම් නිරාකරනය ඇතුළත් වේ.

මෙම මූලාශ්‍රය Praxis Community Projects සහ Hibiscus Initiatives එකතුවෙන් සපයන ලදී. Hibiscus Initiatives යනු බන්ධනාගාරය, ආගමන රැඳවුම්භාරය, බන්ධනාගාරය හෝ හෝ ආගමන රැඳවුම්භාරයෙන් නිදහස් වූ ප්‍රජාව තුළ සහාය අවශ්‍ය කාන්තාවන්ට හෝ මිනිස් ජාවාරමට ගොදුරු වූ කාන්තාවන් සමග කටයුතු කරයි. ඔවුන්ගේ කටයුතුවලට බන්ධනාගාරවල ශුභ සාධනය සහ උපදේශනය, ජාත්‍යන්තර නැවත පදිංචි කරවීම, මිනිස් ජාවාරම මැඩලීම හෝ ප්‍රජාව තුළ නැවත පදිංචි කරවීම සහ ස්වේච්ඡා කටයුතු ඇතුළත් වේ. ඔබ Hibiscus Initiatives ගැන වැඩිදුර දැන ගැනීමට කැමති නම් ඔවුන්ව පහත ආකාරයෙන් සම්බන්ධ කර ගත හැක:

## Hibiscus Initiatives

Resource for London, 356 Holloway Road London N7 6PA
දුරකථනය: +44 (0)20 7697 4120 ෆැක්ස්: +44 (0)20 7697 4272
ඊමේල්: info@hibiscusinitiatives.org.uk
වෙබ් අඩවිය: **www.hibiscusinitiatives.org.uk**

## Praxis Community Projects

විදේශීය ජාතිකයන්ද ඇතුළුව අවදානමට ලක් වූ සංක්‍රමණිකයන්ට
අවවාද, උපදෙස් සහ සිද්ධි කාර්යයන්, නිවාස, ශුභ සාධන ප්‍රතිලාභ සපයයි.

Praxis Community Projects
Pott Street, London E2 0EF
දුරකථනය: +44 (0)20 7729 7985 ෆැක්ස්: +44 (0)20 7729 0134
ඊමේල්: advice@praxis.org.uk
වෙබ් අඩවිය: **www.praxis.org.uk**